රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 12/2005 (VI)

මගේ අංකය : EST-6/04/INS/1010
රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2016.04.29

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**2005 අයවැයෙන් යෝජිත රාජ්‍ය නිලධරයන් සඳහා වූ නව රක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීම (අග්‍රහාර)**

2005.05.18 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005 සහ එහි සංශෝධන ලෙස නිකුත් කළ චක්‍රලේඛ විධිවිධාන කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

02. දැනට ක්‍රියාත්මක එකී විධිවිධාන, දායකත්වය ස්වකැමැත්ත මත වන අග්‍රහාර ''රිදී යෝජනා ක්‍රමය'' සහ අග්‍රහාර ''රන් යෝජනා ක්‍රමය'' යන නව යෝජනා ක්‍රම දෙකක් යටතේ තවදුරටත් පුළුල් කිරීමටත්, විශ්‍රාමික රාජ්‍ය නිලධරයන් සඳහා අග්‍රහාර රැකවරණ නමින් නව යෝජනා ක්‍රමයක් හඳුන්වා දීමටත් 2016.03.30 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

03. දැනට අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ සඳහා දායකයා විසින් ගෙවනු ලබන රු.125/-ක දායකත්ව මුදල වෙනුවට ස්වකැමැත්ත මත රු.300/- මාසික දායකත්වයක් දරමින් රිදී යෝජනා ක්‍රමයට ද, රු. 600/-ක මාසික දායකත්වයක් දරමින් රන් යෝජනා ක්‍රමයට ද දායකවීමට රාජ්‍ය නිලධරයන්ට මේ අනුව අවස්ථාව සැලසේ. රිදී යෝජනා ක්‍රමයට අදාළ ප්‍රතිලාභ ඇමුණුම 01 මගින් ද රන් යෝජනා ක්‍රමයට අදාළ ප්‍රතිලාභ ඇමුණුම 02 මගින් ද දැක්වේ.

3.1 ඉහත පරිදි ඉහළ දායකත්ව මුදලක් සහිත ප්‍රතිලාභ ක්‍රමයක් සඳහා ස්වකීය කැමත්ත ප්‍රකාශ කිරීමෙන් පසු දායකයා විශ්‍රාම ගන්නා තෙක් නැවත එය අඩු දායකත්ව මුදලක් සහිත ප්‍රතිලාභ ක්‍රමයක දායකත්වය ලබාගැනීම සඳහා වෙනස් කළ නොහැක. අවශ්‍ය වන්නේ නම් රිදී

යෝජනා ක්‍රමයට මනාපය ප්‍රකාශ කළ දායකයෙකුට පසුව රන් යෝජනා ක්‍රමයට දායකවීමට ස්වකීය මනාපය වෙනස් කිරීමට පමණක් ඉඩදිය හැකි ය.

3.2 දැනට සාමාන්‍ය අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමයට දායක වී ඇති නිලධරයන් රිදී යෝජනා ක්‍රමය හෝ රන් යෝජනා ක්‍රමය සඳහා දායකවීමට මෙහි ඇමුණුම 03 පරිදි ස්වකීය කැමැත්ත දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය සමඟ ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ඉදිරිපත් කළ යුතු ය.

3.3 ඉහළ ප්‍රතිලාභ හිමි යෝජනා ක්‍රමයන් සඳහා මනාපය ප්‍රකාශ කළ විටක දී සිය පළමු වාරිකය අය වූ දින සිට මාස 03ක් ගත වන තුරු හිමි වනුයේ ඒ වන විට දරමින් සිටි මුල් දායකත්ව මුදලට අදාළ යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ වේ.

3.4 තම මුල් පත්වීමේදීම රිදී යෝජනා ක්‍රමය හෝ රන් යෝජනා ක්‍රමය සඳහා මනාපය ප්‍රකාශ කරන නිලධරයෙකුට සිය පළමු වාරිකය අයවූ දින සිටම එම යෝජනා ක්‍රමවලට අදාළ ප්‍රතිලාභ හිමිකම ලැබේ.

04. විශ්‍රාමික රාජ්‍ය නිලධරයන් සඳහා රු.200/-ක මාසික දායකත්වය මත හඳුන්වා දෙන අග්‍රහාර රැකවරණ රක්ෂණ යෝජනා ක්‍රමය පහත කොන්දේසි හා නියමයන්ට යටත්ව ඇමුණුම 04හි දැක්වෙන ප්‍රතිලාභ වෙනුවෙන් බලපැවැත්වේ.

4.1 2016.01.01 දින සිට විශ්‍රාම ගනු ලැබූ සියලුම රාජ්‍ය නිලධරයන් සහ මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වන දින සිට ඉදිරියට විශ්‍රාම ගනු ලබන සියලුම රාජ්‍ය නිලධරයන් මෙම රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා අනිවාර්ය දායකත්වයක් දැරිය යුතු ය.

4.2 චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක වන දින සිට දායක මුදල් අයකරනු ලබන අතර 2016.01.01 දින සිට චක්‍රලේඛය ක්‍රියාත්මක වන දින දක්වා කාලය වෙනුවෙන් හිඟ දායක මුදල් අයකිරීමක් සිදු කරනු නොලැබේ.

4.3 ප්‍රතිලාභ සඳහා හිමිකම් ලබනුයේ දායකයා පමණක් වන අතර දායක මුදල් අය වූ දිනෙන් පසු ඇතිවන සිද්ධීන් හා අවස්ථා සඳහා ප්‍රතිලාභ ලබා ගත හැකි ය.

4.4 වයස අවුරුදු 70 දක්වා ප්‍රතිලාභ හිමිකම් ලැබිය හැකි ය.

4.5 විශ්‍රාමික රාජ්‍ය නිලධරයන්ගේ දායක මුදල් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් අයකර මාසිකව ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ප්‍රේෂණය කළ යුතු ය.

4.6 දායකයා විසින් ප්‍රතිලාභ ඉල්ලුම්පත්‍ර සත්‍ය හා නිවැරදි බවට ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී මගින් තහවුරු කර ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ඉදිරිපත් කළ යුතු ය.

05. විශ්‍රාමික රාජ්‍ය නිලධරයන් සඳහා හඳුන්වා දෙන අග්‍රහාර රැකවරණ රක්ෂණ යෝජනා ක්‍රමය පිළිබඳ අදාළ පරිපාලන විධිවිධාන ඇතුළත් උපදෙස් චක්‍රලේඛයක් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉදිරියේ දී නිකුත් කරනු ඇත.

06. මෙම චක්‍රලේඛ විධිවිධාන 2016.05.01 දින සිට ක්‍රියාත්මක වේ.

ජේ. දඩල්ලගේ
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය

**ඇමුණුම 01**

## අග්‍රහාර "රිදී යෝජනා ක්‍රමය"

**වාරිකය ගෙවීම**

රාජ්‍ය සේවයේ සහ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි/ දායක විශ්‍රාම වැටුප් හිමි තනතුරු දරන සියලුම නිලධාරීහු මෙම රක්ෂණ ක්‍රමයට ඇතුළු වීම සඳහා සුදුසුකම් ලබති. රු. 300/-ක මාසික දායකත්වයක් දැරිය යුතු වන මෙම යෝජනා ක්‍රමය සියලුම රාජ්‍ය සේවකයින් හට අනිවාර්ය නොවේ.

**උපලේඛනය 01 - ශල්‍යකර්ම සහ රෝහල් වියදම් ප්‍රතිපූර්ණ රක්ෂණාවරණය**

| | **ප්‍රතිලාභ වර්ගය** | **සීමාව** |
|---|---|---|
| 01 | රෝහල් සහ සාත්තු නිවාස ගාස්තු | රු. 50,000.00 (දිනකට කාමර ගාස්තුව රු. 5,000 බැගින්) |
| 02 | උපදේශක විශේෂඥ වෛද්‍යවරයන්ගේ නිර්දේශ මත ලබාදෙන විශේෂ ප්‍රතිකාර හා හෙද සේවා සඳහා සහ රෝහල්, සාත්තු නිවාසයන්හි විශේෂඥ ප්‍රතිකාර සඳහා වැයවන ශල්‍යකර්ම සඳහා | රු.60,000.00 (පවුල් ඒකකයක් සඳහා) |
| 03 | ආරෝග්‍යශාලාවක හෝ සාත්තු නිවාසයක නේවාසික ප්‍රතිකාර ලබාගැනීමේ දී වෛද්‍ය උපදේශන සේවා හෝ විශේෂඥ වෛද්‍ය සේවා සඳහා ගාස්තු හා නිර්වින්දන වෛද්‍යවරුන්ගේ ගාස්තු | රු. 35,000.00 (පවුල් ඒකකයක් සඳහා) |
| 04 | සූක්ෂම චිකිත්සා ප්‍රතිකාර, එක්ස් කිරණ රශ්මි හා රේඩියම් පරීක්ෂණ හා ප්‍රතිකාර, විදුලිමය ප්‍රතිකාර, කායික චිකිත්සා ඇතුළත් විශේෂඥ සේවා ගාස්තු | රු. 30,000.00 (පවුල් ඒකකයක් සඳහා) |

| | | |
|---|---|---|
| 05 | ඉහත සඳහන් අංක 01 සිට 04 දක්වා සිද්ධීන්ට යටත්ව පෞද්ගලික ආයුර්වේද රෝහලක නේවාසිකව වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම වෙනුවෙන් (පෞද්ගලික ආයුර්වේද රෝහල දේශීය වෛද්‍ය විෂය භාර අමාත්‍යාංශය යටතේ ලියාපදිංචිව තිබිය යුතු ය.) | රු. 160,000.00<br>(උපරිමය) |
| 06 | ඉහත සඳහන් අංක 01 සිට 04 දක්වා සිද්ධීන් වෙනුවෙන්<br>(අ) එක් සිද්ධියක් සඳහා උපරිමය<br>(ආ) එක් වර්ෂයක් සඳහා උපරිමය | <br>රු. 160,000.00<br>රු. 250,000.00 |
| 07 | සාමාජිකයන් සඳහා පමණක් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි අක්ෂි පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයෙකුගේ නිර්දේශය මත වසර තුනකට වරක් ඇස් කණ්ණාඩි ලබාගැනීම | රු. 3,500.00 |
| 08 | I. රජයේ රෝහලක නේවාසිකව ප්‍රතිකාර ලබා ගන්නේ නම් සාමාජිකයා ඇතුළු පවුල් ඒකකය වෙනුවෙන්<br>II. විශේෂඥ වෛද්‍ය නිර්දේශ මත මිළදී ගන්නා ඖෂධ වියදම් සඳහා (රෝහල්ගතව සිටින කාලයේ දී පමණි)<br>III. විශේෂඥ වෛද්‍ය නිර්දේශ මත සිදු කරන වෛද්‍ය පරීක්ෂණ සඳහා ( රෝහල්ගතව සිටින කාලයේ දී පමණි ) | රු.10,000.00<br>(දිනකට රු.1,000 බැගින්)<br>රු.60,000.00<br>රු.30,000.00 |
| 09 | රජයේ ආයුර්වේද රෝහලක, වාට්ටුවක නේවාසිකව ප්‍රතිකාර ලබා ගන්නේ නම් සාමාජිකයා ඇතුළු පවුල් ඒකකය වෙනුවෙන් | රු. 10,000.00<br>දිනකට රු.1000 බැගින් |
| 10 | රජයේ රෝහලක දී සිදු කෙරෙන සාමාන්‍ය දරු උපත් ආවරණය/ මළ දරු උපත් ආවරණය, ගබ්සාවීම්, සිසේරියන් දරු උපත් සඳහා ලබාදෙන දීමනාව (එක් ඇතුළුවීමක දී උපරිම දින 05) | රු. 1,500.00<br>(දිනකට) |

| | | |
|---|---|---|
| 11 | සාමාන්‍ය දරු උපත් ආවරණය (පෞද්ගලික රෝහලක දී) | රු. 25,000.00 |
| 12 | පෞද්ගලික රෝහලක සිදු කරන සිසේරියන් සැත්කමක් සඳහා (සාමාජිකයා සඳහා පමණයි) | රු. 60,000.00 |
| 13 | පවුලේ සාමාජිකයන් සඳහා හෘදය ආශ්‍රිත ශල්‍යකර්ම වෙනුවෙන් | රු. 150,000.00 |

**උපලේඛනය 02 - ශල්‍යකර්ම සහ රෝහල් වියදම් ප්‍රතිපූර්ණ රක්ෂණාවරණය**

| සාමාජිකයින් සඳහා පමණක් පහත සඳහන් බරපතල ශල්‍යකර්ම වියදම් ප්‍රතිපූර්ණය කිරීම | සීමාව |
|---|---|
| මොළයේ ශල්‍යකර්ම | රු.800,000.00 |
| වකුගඩු බද්ධ කිරීම | රු.800,000.00 |
| හෘද සැත්කම් | |
| දායකයා සඳහා | රු.800,000.00 |
| RF Ablation (දායකයා සඳහා) | රු350,000.00 |
| පිළිකා ශල්‍යකර්ම වියදම් | රු.400,000.00 |
| දණහිස් බද්ධ කිරීම | රු.150,000.00 |
| උකුල් ඇටය බද්ධ කිරීම | රු.150,000.00 |
| ශ්‍රවණ ආධාර | රු. 75,000.00 |

**<u>පවුල් ඒකකය :</u>**

විවාහක සාමාජිකයන් :- සාමාජිකයා, කලත්‍රයා සහ රැකියා විරහිත අවිවාහක හා යැපෙන අවුරුදු 21ට අඩු දරුවන් සහ අවුරුදු 21 ඉක්ම වුවද මුළුමනින්ම ආබාධ වූ අවිවාහක හා සේවා වියුක්ත ළමුන්

අවිවාහක සාමාජිකයන් :- සාමාජිකයා සහ වයස අවුරුදු 70ට අඩු සාමාජික නිලධරයාගේ දෙමාපියන්

**උපලේඛනය 03 - පෞද්ගලික හදිසි අනතුරු රක්ෂණාවරණය**

1. පුද්ගල හදිසි අනතුරු රක්ෂණාවරණය

    1.1 හදිසි අනතුරකින් සිදුවන මරණයක දී පුද්ගල හදිසි අනතුරු රක්ෂණාවරණය යටතේ රු. 1,000,000.00 ලබාදේ.

    1.2 හදිසි අනතුරක් හේතුවෙන් පමණක් සිදුවන ස්ථිර පූර්ණ අකර්මණ්‍යතාවක දී හෝ ස්ථිර අර්ධ අකර්මණ්‍යතාවක දී රු. 1,000,000.00 ලබාදේ.

**ප්‍රතිලාභ උපලේඛනය**

| | | | |
|---|---|---|---|
| 01 | ඇස් දෙකෙහිම පෙනීම ස්ථිර හා පූර්ණ වශයෙන් අහිමි වී යාම. | 100% | හදිසි අනතුරු සිදුවී මාස 03ක් ඇතුළත සිදුවන |
| 02 | කපා ඉවත් කිරිම හේතුවෙන් අත් දෙකම හෝ පාද දෙකම හෝ එක් පාදයක් හා එක් අතක් පූර්ණ වශයෙන් අහිමි වීම. | 100% | |
| 03 | කපා ඉවත් කිරීම හේතුවෙන් එක් අතක් හෝ එක් පාදයක් පූර්ණ වශයෙන් අහිමි වීම සමඟ එක් ඇසක පෙනීම ස්ථිර හා පූර්ණ වශයෙන් අහිමි වීම. | 100% | |
| 04 | එක් ඇසක පෙනීම ස්ථිර හා පූර්ණ වශයෙන් අහිමි වීම | 50% | |
| 05 | කපා ඉවත් කිරිම හේතුවෙන් එක් අතක් හෝ එක් පාදයක් අහිමි විම | 50% | |

**පහත සඳහන් අවස්ථාවල දී වන්දි ගෙවීම සිදුකරනු නොලැබේ.**

1. එක් සිදුවීමක දී හදිසි අනතුරු හේතුවෙන් ඇතිවන ඉහත (01) සිට (05) දක්වා ප්‍රතිඵල අවස්ථා අතරින් දායකයාට වඩාත් ඉහළ ප්‍රතිලාභ ලැබෙන එක් අවස්ථාවක් සඳහා පමණක් වන්දි ලබාදීම සිදු කරනු ලැබේ. එම ප්‍රතිඵල අතරින් කිහිපයකට දායකයා මුහුණ දී ඇති විටකදී ප්‍රතිලාභ ලබාදෙන ප්‍රතිඵලයට හැර වෙනත් ප්‍රතිඵලයකට හෝ පසුව ඇතිවන සිදුවීමකින් ඇතිවන ප්‍රතිඵලයකට නැවත වන්දි ගෙවීම සිදු කරනු නොලැබේ.

## 2. ස්වාභාවික මරණ රක්ෂණාවරණය

මෙම රක්ෂණාවරණය මගින් ස්වාභාවික හේතුවක් මුල්කොට සිදුවන මරණ සඳහා වන්දි ලබාදෙනු ලැබේ.
(මෙම ආවරණය රක්ෂණ ඔප්පුවේ දිනයේ සිට දින 90කට පසු ක්‍රියාත්මක වේ.)

2.1 ස්වාභාවික මරණ ආවරණය - සාමාජිකයින් සඳහා පමණි. - රු. 400,000.00

2.2 වෙනත් රෝගාබාධයක් හේතුවෙන් සිදුවන ස්ථිර පූර්ණ අකර්මණ්‍යතාවක දී හෝ ස්ථිර අර්ධ අකර්මණ්‍යතාවක දී - රු. 100,000.00 (ජීවිත කාලයකටම එක් වරක් පමණි)

ඇමුණුම 02

## <u>අග්‍රහාර "රන් යෝජනා ක්‍රමය"</u>

**වාරිකය ගෙවීම**

රාජ්‍ය සේවයේ සහ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි/ දායක විශ්‍රාම වැටුප් හිමි තනතුරු දරන සියලුම නිලධාරීහු මෙම රක්ෂණ ක්‍රමයට ඇතුළු වීම සඳහා සුදුසුකම් ලබති. රු. 600/-ක මාසික වාරිකයක් ගෙවිය යුතු වන මෙම යෝජනා ක්‍රමය සියලුම රාජ්‍ය සේවකයින් හට අනිවාර්ය නොවේ.

**උපලේඛනය 01 - ශල්‍යකර්ම සහ රෝහල් වියදම් ප්‍රතිපූර්ණ රක්ෂණාවරණය**

| | ප්‍රතිලාභ වර්ගය | සීමාව |
|---|---|---|
| 01 | රෝහල් සහ සාත්තු නිවාස ගාස්තු | රු.80,000.00 (දිනකට කාමර ගාස්තුව රු.8,000 බැගින්) |
| 02 | උපදේශක විශේෂඥ වෛද්‍යවරයන්ගේ නිර්දේශ මත ලබාදෙන විශේෂ ප්‍රතිකාර හා හෙද සේවා සඳහා සහ රෝහල්, සාත්තු නිවාසයන්හි විශේෂඥ ප්‍රතිකාර සඳහා වැයවන ශල්‍යකර්ම සඳහා | රු.80,000.00 (පවුල් ඒකකයක් සඳහා) |
| 03 | ආරෝග්‍යශාලාවක හෝ සාත්තු නිවාසයක නේවාසික ප්‍රතිකාර ලබාගැනීමේ දී වෛද්‍ය උපදේශන සේවා හෝ විශේෂඥ වෛද්‍ය සේවා සඳහා ගාස්තු හා නිර්වින්දන වෛද්‍යවරුන්ගේ ගාස්තු | රු.50,000.00 (පවුල් ඒකකයක් සඳහා) |
| 04 | සුක්ෂම චිකිත්සා ප්‍රතිකාර, එක්ස් කිරණ රශ්මි හා රේඩියම් පරීක්ෂණ හා ප්‍රතිකාර, විදුලිමය ප්‍රතිකාර, කායික චිකිත්සා ඇතුළත් විශේෂඥ සේවා ගාස්තු | රු.40,000.00 (පවුල් ඒකකයක් සඳහා) |

| | | |
|---|---|---|
| 05 | ඉහත සඳහන් අංක 01 සිට 04 දක්වා සිද්ධීන්ට යටත්ව පෞද්ගලික ආයුර්වේද රෝහලක නේවාසිකව වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම වෙනුවෙන් (පෞද්ගලික ආයුර්වේද රෝහල දේශීය වෛද්‍ය විෂය භාර අමාත්‍යාංශය යටතේ ලියාපදිංචිව තිබිය යුතු ය. | රු.200,000.00 (උපරිමය) |
| 06 | ඉහත සඳහන් අංක 01 සිට 04 දක්වා සිද්ධීන් වෙනුවෙන්<br>(අ) එක් සිද්ධියක් සඳහා උපරිමය<br>(ආ) එක් වර්ෂයක් සඳහා උපරිමය | <br>රු.200,000.00<br>රු.350,000.00 |
| 07 | සාමාජිකයන් සඳහා පමණක් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි අක්ෂි පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයෙකුගේ නිර්දේශය මත වසර තුනකට වරක් ඇස් කණ්ණාඩි ලබාගැනීම | රු5,000.00 |
| 08 | I. රජයේ රෝහලක වාට්ටුවක නේවාසිකව ප්‍රතිකාර ලබා ගන්නේ නම් සාමාජිකයා ඇතුළු පවුල් ඒකකය වෙනුවෙන් | රු.30,000.00 (දිනකට රු.3,000 බැගින්) |
| | II. විශේෂඥ වෛද්‍ය නිර්දේශ මත මිළදී ගන්නා ඖෂධ වියදම් සඳහා (රෝහල්ගතව සිටින කාලයේ දී පමණි) | රු.80,000.00 |
| | III. විශේෂඥ වෛද්‍ය නිර්දේශ මත සිදු කරන වෛද්‍ය පරීක්ෂණ සඳහා ( රෝහල්ගතව සිටින කාලයේ දී පමණි ) | රු.40,000.00 |
| 09 | රජයේ ආයුර්වේද රෝහලක, වාට්ටුවක නේවාසිකව ප්‍රතිකාර ලබා ගන්නේ නම් සාමාජිකයා ඇතුළු පවුල් ඒකකය වෙනුවෙන් | රු. 30,000.00 (දිනකට රු.3000 බැගින්) |

| | | |
|---|---|---|
| 10 | රජයේ රෝහලක දී සිදු කෙරෙන සාමාන්‍ය දරු උපත් ආවරණය/ මළ දරු උපත් ආවරණය, ගබ්සාවීම්, සිසේරියන් දරු උපත් සඳහා ලබාදෙන දීමනාව (එක් ඇතුළුවීමක දී උපරිම දින 05) | දිනකට රු.3,000 බැගින් |
| 11 | සාමාන්‍ය දරු උපත් ආවරණය (පුද්ගලික රෝහලක දී) | රු. 50,000.00 |
| 12 | පෞද්ගලික රෝහලක සිදු කරන සිසේරියන් සැත්කමක් සඳහා (සාමාජිකයන් සඳහා පමණයි) | රු.100,000.00 |
| 13 | පවුලේ සාමාජිකයන් සඳහා හෘදය ආශ්‍රිත ශල්‍යකර්ම වෙනුවෙන් | රු.200,000.00 |

**උපලේඛනය 02 - ශල්‍යකර්ම සහ රෝහල් වියදම් ප්‍රතිපූර්ණ රක්ෂණාවරණය**

| **සාමාජිකයින් සඳහා පමණක් පහත සඳහන් බරපතල ශල්‍යකර්ම වියදම් ප්‍රතිපූර්ණය කිරීම** | **සීමාව** |
|---|---|
| මොළයේ ශල්‍යකර්ම | රු.1,200,000.00 |
| වකුගඩු බද්ධ කිරීම | රු.1,200,000.00 |
| හෘද සැත්කම් | |
| දායකයා සඳහා | රු.1,000,000.00 |
| RF Ablation | රු.500,000.00 |
| පිළිකා ශල්‍යකර්ම වියදම් | රු.600,000.00 |
| දණහිස් බද්ධ කිරීම | රු.250,000.00 |
| උකුල් ඇටය බද්ධ කිරීම | රු.250,000.00 |
| ශ්‍රවණ ආධාර | රු. 100,000.00 |

**පවුල් ඒකකය :**

විවාහක සාමාජිකයන් :- සාමාජිකයා, කලත්‍රයා සහ රැකියා විරහිත අවිවාහක හා යැපෙන අවුරුදු 21ට අඩු දරුවන් සහ අවුරුදු 21 ඉක්ම වුවද මුළුමනින්ම ආබාධ වූ අවිවාහක හා සේවා වියුක්ත ළමුන්

අවිවාහක සාමාජිකයන් :- සාමාජිකයා සහ වයස අවුරුදු 70ට අඩු සාමාජික නිලධරයාගේ දෙමාපියන්

**උපලේඛනය 03 - පෞද්ගලික හදිසි අනතුරු රක්ෂණාවරණය**

1. පුද්ගල හදිසි අනතුරු රක්ෂණාවරණය

 1.1 හදිසි අනතුරකින් සිදුවන මරණයක දී පුද්ගල හදිසි අනතුරු රක්ෂණාවරණය යටතේ රු.2,000,000.00 ලබාදේ.

 1.2 හදිසි අනතුරක් හේතුවෙන් පමණක් සිදුවන ස්ථිර පූර්ණ අකර්මණ්‍යතාවක දී හෝ ස්ථිර අර්ධ අකර්මණ්‍යතාවක දී රු. 1,500,000.00 ලබාදේ.

**ප්‍රතිලාභ උපලේඛනය**

| | | | |
|---|---|---|---|
| 01 | ඇස් දෙකෙහිම පෙනීම ස්ථිර හා පූර්ණ වශයෙන් අහිමි වී යාම. | 100% | හදිසි අනතුරු සිදුවී මාස 03ක් ඇතුළත සිදුවන |
| 02 | කපා ඉවත් කිරිම හේතුවෙන් අත් දෙකම හෝ පාද දෙකම හෝ එක් පාදයක් හා එක් අතක් පූර්ණ වශයෙන් අහිමි වීම. | 100% | |
| 03 | කපා ඉවත් කිරීම හේතුවෙන් එක් අතක් හෝ එක් පාදයක් පූර්ණ වශයෙන් අහිමි වීම සමඟ එක් ඇසක පෙනීම ස්ථිර හා පූර්ණ වශයෙන් අහිමි වීම. | 100% | |
| 04 | එක් ඇසක පෙනීම ස්ථිර හා පූර්ණ වශයෙන් අහිමි වීම | 50% | |
| 05 | කපා ඉවත් කිරිම හේතුවෙන් එක් අතක් හෝ එක් පාදයක් අහිමි විම | 50% | |

**පහත සඳහන් අවස්ථාවල දී වන්දි ගෙවීම සිදුකරනු නොලැබේ.**

1. එක් සිද්ධියකදී හදිසි අනතුරු හේතුවෙන් ඇතිවන ඉහත 01 සිට 05 දක්වා ප්‍රතිඵල අවස්ථා අතරින් දායකයාට වඩාත් ඉහළ ප්‍රතිලාභ ලැබෙන එක් අවස්ථාවක් සඳහා පමණක් වන්දි ලබාදීම සිදු කරනු ලැබේ. එම ප්‍රතිඵල අතරින් කිහිපයකට දායකයා මුහුණ දී ඇති විටකදී ප්‍රතිලාභ ලබා දෙන ප්‍රතිඵලයට හැර වෙනත් ප්‍රතිඵලයකට හෝ පසුව ඇතිවන සිදුවීමකින් ඇතිවන ප්‍රතිඵලයකට නැවත වන්දි ගෙවීම සිදු කරනු නොලැබේ.

2. **ස්වාභාවික මරණ රක්ෂණාවරණය**

මෙම රක්ෂණාවරණය මගින් ස්වාභාවික හේතුවක් මුල්කොට සිදුවන මරණ සඳහා වන්දි ලබාදෙනු ලැබේ.
(මෙම ආවරණය රක්ෂණ ඔප්පුවේ දිනයේ සිට දින 90 කට පසු ක්‍රියාත්මක වේ.)

2.1 ස්වාභාවික මරණ රක්ෂණාවරණය- සාමාජිකයින් සඳහා පමණි. - රු. 700,000.00

2.2 වෙනත් රෝගාබාධයක් හේතුවෙන් සිදුවන ස්ථිර පූර්ණ අකර්මණ්‍යතාවක දී හෝ ස්ථිර අර්ධ අකර්මණ්‍යතාවක දී - රු. 200,000.00 (ජීවිත කාලයකටම එක් වරක් පමණි)

ඇමුණුම 03

**<u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005 (VI) අනුව හඳුන්වා දෙන නව රක්ෂණ යෝජනා ක්‍රම සඳහා ඉල්ලුම් කිරීමේ ආකෘති පත්‍රය</u>**

01. වාසගම සමඟ සම්පූර්ණ නම : ..............................................................................................

..............................................................................................................................................

02. පෞද්ගලික ලිපිනය : ..............................................................................................

..............................................................................................................................................

03. ජාතික හැඳුනුම්පත් අංකය : ..............................................................................................

04. වර්තමාන තනතුර : ..............................................................................................

05. දායකයාගේ දුරකථන අංකය : ජංගම :.......................... කාර්යාලය :............................

06. අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / පළාත් සභාවේ නම : ..................................................

..............................................................................................................................................

07. කාර්යාල ලිපිනය : ..............................................................................................

08. වර්තමාන අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය :

සාමාන්‍ය යෝජනා ක්‍රමය ☐ රිදී යෝජනා ක්‍රමය ☐ රන් යෝජනා ක්‍රමය ☐

09. දායකත්වය දැරීමට කැමති නව රක්ෂණ යෝජනා ක්‍රමය :

රිදී යෝජනා ක්‍රමය ☐ රන් යෝජනා ක්‍රමය ☐

10. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය : නිර්දේශ කරමි / නොකරමි.

නම :......................................................................

තනතුර :......................................................................

අත්සන :......................................................................

(නිල මුද්‍රාව යොදන්න)

ඇමුණුම 04

<u>අග්‍රහාර රක්‍ෂණ යෝජනා ක්‍රමය</u>

| | ප්‍රතිලාභ වර්ගය | සීමාව |
|---|---|---|
| 01 | රෝහල් සහ සාත්තු නිවාස ගාස්තු | රු.30,000.00 (දිනකට කාමර ගාස්තුව රු.3000/- බැගින්) |
| 02 | උපදේශක විශේෂඥ වෛද්‍යවරයන්ගේ නිර්දේශ මත ලබාදෙන විශේෂ ප්‍රතිකාර හා හෙද සේවා සඳහා සහ රෝහල්, සාත්තු නිවාසයන්හි විශේෂඥ ප්‍රතිකාර සඳහා වැයවන ශල්‍යකර්ම සඳහා | රු. 50, 000.00 |
| 03 | ආරෝග්‍යශාලාවක හෝ සාත්තු නිවාසයක නේවාසික ප්‍රතිකාර ලබාගැනීමේ දී වෛද්‍ය උපදේශන සේවා හෝ විශේෂඥ වෛද්‍ය සේවා සඳහා ගාස්තු හා නිර්වින්දන වෛද්‍යවරුන්ගේ ගාස්තු | රු. 20,000.00 |
| 04. | සූක්‍ෂම චිකිත්සා ප්‍රතිකාර, එක්ස් කිරණ රශ්මි හා රේඩියම් පරීක්‍ෂණ හා ප්‍රතිකාර, විදුලිමය ප්‍රතිකාර, කායික චිකිත්සා ඇතුළත් විශේෂඥ සේවා ගාස්තු | රු. 20,000.00 |
| 05 | ඉහත සඳහන් අංක 01 සිට 04 දක්වා සිද්ධීන්ට යටත්ව පෞද්ගලික ආයුර්වේද රෝහලක නේවාසිකව වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම වෙනුවෙන් (පෞද්ගලික ආයුර්වේද රෝහල දේශීය වෛද්‍ය විෂය භාර අමාත්‍යාංශය යටතේ ලියාපදිංචිව තිබිය යුතු ය.) | රු. 120,000.00 (උපරිමය) |
| 06 | ඉහත සඳහන් අංක 01 සිට 04 දක්වා සිද්ධීන් වෙනුවෙන්<br>(අ) එක් සිද්ධියක් සඳහා උපරිමය<br>(ආ) එක් වර්ෂයක් සඳහා උපරිමය | රු. 120,000.00<br>රු. 150,000.00 |

| | | |
|---|---|---|
| 07 | I. රජයේ රෝහලක නේවාසිකව ප්‍රතිකාර ලබා ගන්නේ නම්<br><br>II. විශේෂඥ වෛද්‍ය නිර්දේශ මත මිළදී ගන්නා ඖෂධ වියදම් සඳහා (රෝහල්ගතව සිටින කාලයේ දී පමණි)<br><br>III. විශේෂඥ වෛද්‍ය නිර්දේශ මත සිදු කරන වෛද්‍ය පරීක්ෂණ සඳහා ( රෝහල්ගතව සිටින කාලයේදී පමණි ) | රු.5,000.00<br>(දිනකට රු.500 බැගින්)<br><br>රු. 50,000.00<br><br>රු. 20,000.00 |
| 08 | රජයේ ආයුර්වේද රෝහලක, වාට්ටුවක නේවාසිකව ප්‍රතිකාර ලබා ගන්නේ නම් | රු.5,000.00<br>(දිනකට රු. 500 බැගින්) |
| 09 | I. පහත සඳහන් හෘදය ආශ්‍රිත ශල්‍යකර්ම වෙනුවෙන් ප්‍රතිපූර්ණය කිරීම (උපරිමය)<br><br>1. Heart Attack – (Myocardial Refraction)<br>2. Coronary Artery Disease (Coronary by–pass Surgery)<br>3. Stroke (Cerebra Vascular accident)<br>4. Double (Mitral & Aortic) Value Replacement<br>5. Atrial Septal Defect<br>6. Percutancous Transluminial Cororany Angioplast (PTC)<br>7. Fallot Tetrology<br>8. Bruganda Syndrome<br>9. Implanting Pacemaker – Single<br>10. Implanting Pacemaker – Double<br>11. Mitral Valve Replacement<br><br>II. RF Ablation (උපරිමය)<br><br>III. (අ) පහත ශල්‍යකර්ම සඳහා (උපරිමය)<br>1. Cancer<br>2. Kidney Transplant | රු.500,000.00<br><br>රු.225,000.00<br><br>රු. 200,000.00 |

| | | |
|---|---|---|
| | (ආ) පහත සඳහන් ශල්‍යකර්ම සඳහා<br>3. Reanal Failure<br>4. Major Organ Transplant, such as lung or bone marrow, However this benefit will not be paid to a donor of a major organ<br>5. Paralysis<br>6. Multiple Sclerosis<br>7. Primary pulmonary Arterial Hypertension<br>8. Fulminate Hepatitis | රු.150,000.00 |
| 10 | ශ්‍රවණ ආධාර | රු.50,000.00 |
| 11 | ස්වාභාවික මරණයක දී<br>හදිසි අනතුරක් මගින් සිදුවන මරණයක දී | රු. 150,000.00<br>රු. 600,000.00 |